" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 SLSI
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/05-2023 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2023.04. 24

**ඉතා වැදගත්/ ප්‍රමුඛයි**

**පාලන චක්‍රලේඛ : 02/2023**

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම් (බ.ප.),

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ( බ.ප.)

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ( බ.ප.)

පළාත් පාලන කොමසාරිස් ( බ.ප.)

අධ්‍යක්ෂ , අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ( බ.ප.)

<u>ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය</u>

ශ්‍රී ලංකාව තුළ ඩෙංගු රෝගය සීග්‍රයෙන් ව්‍යාප්ත වීමේ අවදානමක් මේ වන විට උද්ගතව පවතින බැවින් තවදුරටත් ව්‍යාප්ත වීම වළක්වාගැනීම සඳහා සියලු ආයතනවල සක්‍රිය දායකත්වයෙන් යුතුව ඩෙංගු මර්දන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. වර්තමාන සංඛ්‍යාලේඛන දත්ත අනුව, බස්නාහිර පළාත අධිඅවදානම් කලාපයක් ලෙස මේ වන විට හඳුනාගෙන ඇති අතර, සීග්‍ර රෝග ව්‍යාප්තියක් ඇති වීමේ අවදානමක් පෙන්නුම් කරයි.

02. ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද අංක PS/EAD/Circular/06/2023 හා 2023.04.20 දිනැති චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් ලිපිනයට යොමු කර ඇත. එහි අඩංගු කරුණු පිළිබඳව ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, ඔබ යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

03. බස්නාහිර පළාත තුල ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කරගැනීම අරමුණු කරගෙන, 2023.04.21 දින පැවති පළාත් ඩෙංගු මර්දන ප්‍රගති සමාලෝචන රැස්වීමේදී, බස්නාහිර පළාතේ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් පිළිබඳ දත්ත, කීට විද්‍යා දත්ත පදනම් කරගෙන බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් **2023** අප්‍රේල් **26** සිට මැයි **02** දක්වා ඩෙංගු මර්දන සතියක් ප්‍රකාශයට පත්කර ඇත.

04. එසේම එම ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද, ඩෙංගු මර්දන සතිය තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන යටතේ පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබ අමාත්‍යාංශය යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තු / ආයතන හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා වෙනත් අදාළ සංවිධාන සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

I. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලය, පළාත් ඩෙංගු මර්දන ඒකකය ඇතුළු අනෙකුත් ආයතන වෙතින් ඩෙංගු රෝග ව්‍යාප්තියේ අධි අවදානම් කලාප පිළිබඳ මූලික තොරතුරු ලබා ගනිමින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම මත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම විධිමත් කරමින් රෝග මර්දනය සඳහා මෙන්ම රෝග සුවකිරීම සඳහා මනා කැපවීමෙන් යුතුව විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා සියළු පාර්ශව සම්බන්ධ කර ගැනීම කල යුතු වේ.

II. පළාත් පාලන ආයතන ප්‍රධානීන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ද සහය ලබා ගනිමින් තම බල ප්‍රදේශවල ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, රාජ්‍ය හා පෞද්ගලික ආයතන, ආගමික ස්ථාන හා නිවාස පරිශ්‍රවල ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගෙන ඒවා විනාශ කිරීමට කටයුතු කිරීම, එක්රැස්වන කුණු කසළ ඉවත් කිරීම හා එම කුණු කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩපිළිවෙලක් යෙදීමට කටයුතු කල යුතුය.

III. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම වන තෙක් සියළුම පාසල් වල අධ්‍යයන කාල සටහනේ අවසන් කාලච්ඡේදය ඩෙංගු මර්දන වැඩසටහන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කල යුතුය. මේ සම්බන්ධයෙන් කලාප අධ්‍යක්ෂකවරුන්, විදුහල්පතිවරුන් දැනුවත් කිරීමත්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක මේ පිළිබඳව නිරන්තර අධීක්ෂණයක් සිදු කල යුතු බවත් පෙන්වා දෙමි. සියළුම පාසල් ඩෙංගු මදුරුවන්ගෙන් තොර කලාප බවට පත් කරලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

IV. පරිසර පොලිස් ඒකකය සම්බන්ධ කර ගනිමින් ග්‍රාමීය ඩෙංගු මර්දන කමිටු හා සිවිල් සංවිධාන වල සහයෝගය ලබා ගනිමින් ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

V. ධීවර ප්‍රජාව විසින් අත්හැර දමා ඇති භාවිතයට නොගැනෙන ජලය රැස්වන ටැංකි හා බෝට්ටුවල මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

VI. එක් එක් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතනවල ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂාවට ආයතන මට්ටමින් කමිටුවක් පත් කර මදුරුවන් බෝවීම වැළැක්වීමට කටයුතු කල යුතු අතර, මාණ්ඩලික නිලධාරීන් විසින් එහි ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් නිරන්තර අධීක්ෂණයක් පැවතිය යුතු බව අවධාරණය කරමි.

05. ඩෙංගු මර්දන සතියට අදාළ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ අමාත්‍යාංශයට අයත් සියළුම දෙපාර්තමේන්තු, ආයතන හා ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධ කර ගනිමින් මෙම වැඩසටහන කාලීන අවශ්‍යතාවයට අනුව සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර, ඔබ විසින් එම සතිය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන වැඩසටහන් පිළිබඳව වාර්තාවක් සකස් කර ප්‍රධාන ලේකම් වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

06. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් :

01.ජනාධිපති ලේකම් - කා.දැ.ගැ.ස.
02.ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
03.සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ගැ.ස.
04.දිස්ත්‍රික් ලේකම්, කොළඹ/ ගම්පහ/ කළුතර - කා.දැ.ගැ.ස.
05.අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්දන ඒකකය - කා.දැ.ගැ.ස.